# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,378 - 2024 මාර්තු මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2024.03.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 358 |

| | පිටුව |
|---|---|
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබල ාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 අප්‍රේල් මස 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 අප්‍රේල් මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාල යට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය

### විෂය භාර අමාත්‍යවරයාගේ විධානය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියෙන් බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටුකරන හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් අලුත් තක්සේරුවක් හෝ සතොක්ෂණයක් කිරීමට 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තිය ප්‍රකාරව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ විධානය ලබාගත යුතු බවට තීරණය කර ඇත.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වගන්තිය ප්‍රකාරව හොරොව්පොතාන බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපළ මත අලුත් තක්සේරුවක් හා සතොක්ෂණයක් කිරීමට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර මහීපාල හේරත් වන මා විසින් හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවේ වරිපනම් දේපළ මත අලුත් තක්සේරුවක් හා සතොක්ෂණයක් සඳහා විධානය කරනු ලබන්නේ ය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
උතුරුමැද පළාත.

අගෝස්තු මස 14 වැනි දින,
උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය.

03-445

---

## උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය

### විෂය භාර අමාත්‍යවරයාගේ විධානය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියෙන් බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටුකරන කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් අලුත් තක්සේරුවක් හෝ සතොක්ෂණයක් කිරීමට 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වන වගන්තිය ප්‍රකාරව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ විධානය ලබාගත යුතු බවට තීරණය කර ඇත.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපළ මත අලුත් තක්සේරුවක් හා සතොක්ෂණයක් කිරීමට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර මහීපාල හේරත් වන මා විසින් කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවේ වරිපනම් දේපළ මත අලුත් තක්සේරුවක් හා සතොක්ෂණයක් සඳහා විධානය කරනු ලබන්නේ ය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
උතුරුමැද පළාත.

අගෝස්තු මස 14 වැනි දින,
උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය.

03-438

## වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනත සමග කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 2 (2) උපවගන්තිය යටතේ විශේෂ ආඥාවක් අනුව සිදුකරන බලය පැවරීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනත සමග කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 2 (2) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර ලක්ෂමන් යාපා අබේවර්ධන වන මම, වයඹ පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්වරයාට සහය වීමට පත්කර ඇත්තා වූ මීට අමුණා ඇති උපලේඛනයේ I තීරුවෙහි සඳහන් අයට 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධිත වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත හා ඒ යටතේ පනවා ඇති රීති මාලාව යටතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයා වෙත පැවරී ඇත්තා වූ එකී උපලේඛනයේ III තීරුවෙහි සඳහන් සියලුම බලතල එකී උපලේඛනයේ II වන තීරුවෙහි සඳහන් දින සිට මෙයින් පවරමි.

ලක්ෂමන් යාපා අබේවර්ධන,
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

2024 මාර්තු මස 06 වැනි දින,
කුරුණෑගල දී ය.

**උපලේඛනය**

| I වැනි තීරුව | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| ජයසිංහ ආරච්චිගේ ඉන්ද්‍රානි මංගලිකා | 2023.11.01 | සමුපකාර සමිති පනතේ 3, 5, 6, 7, 8, 9, 33, 39, 44 [44(6) හැර], 45, 46, 48, 49, 50, 52, 53, 54, 58 [58 (3) සහ 58 (5) හැර] 59, 68 සහ 72 යන වගන්ති යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාගේ සියලු බලතල රීති මාලාවේ 4, 11, 15, 16(ii), 18, 19, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 48, 49, [49 (xii) හැර], 51, 52 සහ 53 දරන රීති යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාගේ සියලු බලතල. |

03-437

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.